# කොරෝනා වෛරස පිළිබඳ ප්‍රශ්න හා පිළිතුරු
# (මූලාශ්‍රය: ලෝක සෞඛ්‍ය සංවිධානය)

- **කොරෝනා වෛරස යනු මොනවාද?**

කොරෝනා වෛරස සතුන් සහ මිනිසුන් අතර දක්නට ලැබෙන වෛරස කාණ්ඩයකි. මෙයින් ඇතැම් වෛරස මිනිසුන්ට ආසාදන ඇති කරන අතර එම අසාදන  සාමාන්‍ය සෙම්ප්‍රතිශ්‍යාවේ සිට MERS සහ SARS වැනි ශ්වසන රෝග තත්වද ඇති කරයි.

- **"නව" කොරෝනා වෛරසය යනු කුමක්ද?**

"නව" කොරෝනා වෛරසය යනු මිනිසුන් තුළ කලින් හඳුනා නොගත්  කොරෝනා වයිරස ප්‍රභේදයකි. 2019 දෙසැම්බර් මාසයේ චීනයේ වුහාන් ප්‍රදේශයෙන් පළමු වරට වාර්තා වූ මෙම වෛරසය, 2019-nCoV ලෙස හඳුන්වනු ලබයි.

- **මෙම වෛරසය සාර්ස් (SARS-CoV) වෛරසයමද?**

නැත. නව කොරෝනා වෛරසය (2019-nCoV) හා සාර්ස් වෛරසය එකම වෛරස් පවුලකට අයත් නමුත් එම වෛරසයම  නොවේ.

- **මෙය භයානක වෛරසයක්ද?**

අනෙකුත් ශ්වසන රෝග මෙන්ම, නව කොරෝනා වෛරස ආසාදනය මඟින් සෙම්ප්‍රතිශ්‍යාව, උගුරේ වේදනාව, කැස්ස සහ උණ වැනි  සුළු රෝග ලක්ෂණ ඇති කරයි. ඇතැම් පුද්ගලයින්හට නියුමෝනියාව හෝ හුස්ම ගැනීමේ අපහසුතා වැනි දරුණු රෝග තත්ත්ව ඇති විය හැක. කලාතුරකින් මෙම රෝගය මාරාන්තික විය හැක. වයස්ගත පුද්ගලයින් සහ වෙනත් රෝග තත්වයකින් පෙළෙන පුද්ගලයින් (දියවැඩියාව සහ හෘද රෝග වැනි) මෙම වෛරසය ආසාදනය වීමෙන් තදබල ලෙස රෝගාතුර වීමට වැඩි අවදානමක් ඇත.

➢ **සුරතලයට ඇති කරන සතුන්ගෙන් මෙම ආසාදනය ඇතිවිය හැකිද?**

නැත. දැනට පුසන්, බල්ලන් වැනි සුරතලයට ඇති කරන සතුන් ආසාදනය වී ඇති බවට හෝ එම සතුන්ගෙන් මෙම වෛරසය මිනිසුන්ට පැතිරෙන බවට කිසිදු සාක්ෂියක් නොමැත.

➢ **නව කොරෝනා වෛරසය පුද්ගලයෙකුගෙන් පුද්ගලයෙකුට බෝවිය හැකිද?**

ඔව්, ආසාදිත පුද්ගලයෙකු සමග සමීප ඇසුරකින් පසුව මෙම නව කොරෝනා වෛරසය වෙනත් පුද්ගලයෙකුට බෝවිය විය හැක. උදාහරණ ලෙස නිවස තුලදී, කාර්යාලයේදී හෝ රෝහලකදී ආසාදිත පුද්ගලයෙක් හා සමීප ඇසුරකින්.

➢ **මෙම වෛරසයෙන් මම ආරක්ෂා වන්නේ කෙසේද?**

රෝගය පිළිබඳ දැනුවත් වන්න. මෙම වෛරසය පිළිබඳව කාලීන තොරතුරු ලබාගැනීමට වසංගත රෝග විද්‍යා අංශයේ වෙබ් අඩවියට පිවිසෙන්න (www.epid.gov.lk).

ඔබ මෙම වෛරසයෙන් ආරක්ෂා වීම සඳහා පහත සඳහන් ක්‍රියා මාර්ග අනුගමනය කරන්න.

- ඔබගේ දෑත් නිතර සබන් යොදා හෝ මධ්‍යසාර අඩංගු අත්සේදුම් දියරයකින් සෝදා ගන්න.

  එසේ කලයුත්තේ ඇයි?

  සබන් යොදා හෝ මධ්‍යසාර අඩංගු අත්සේදුම් දියරයකින් අත් සේදීමෙන් ඔබගේ අතෙහි තැවරී ඇති වෛරස විනාශ වේ.

- කැස්ස, කිවිසුම් යෑම හෝ උණෙන් පෙලෙන පුද්ගලයන් හා ඔබ අතර අවම වශයෙන් මීටරයක (අඩි තුනක) පරතරයක් තබා ගන්න.

  එසේ කලයුත්තේ ඇයි?

  මෙම වෛරසය ආසාදනය වූ පුද්ගලයෙක් කහින විටදී හෝ කිවිසුම් යවන විටදී වෛරසය අඩංගු බිඳිති පිටවේ. ඔබ එම පුද්ගලයාට ඉතා සමීප ලෙස සිටී නම්, ඔබ ආශ්වසයේදී මෙම වෛරසය ඔබට ඇතුළු වියහැක.

- ඔබගේ ඇස්, නාසය හා මුඛය ඇල්ලීමෙන් වළකින්න.

  එසේ කලයුත්තේ ඇයි?

  ඔබගේ දෙඅත් වෛරස මගින් අපවිත්‍ර වූ පෘෂ්ටයන් ස්පර්ශ කිරීමට ඉඩ ඇත. එලෙස අපවිත්‍ර වූ අත්වලින් ඔබගේ ඇස්, නාසය හා මුඛය ස්පර්ශ කිරීමෙන් එම පෘෂ්ටවල සිට වෛරස ඔබට සම්ප්‍රේෂණය විය හැක.

- ඔබට උණ, කැස්ස සහ හුස්ම ගැනීමේ අපහසුතාවයක් ඇත්නම් ඉක්මනින් වෛද්‍ය ප්‍රතිකාර ලබා ගන්න. ඔබ නව කොරෝනා වෛරසය වාර්තා වී ඇති චීනයේ සංචාරය කර ඇත්නම් හෝ ඔබ චීනයේ සංචාරය කර පැමිණි ශ්වසන රෝග ලක්ෂණ ඇති අයෙකු සමීපව ආශ්‍රය කලේ නම්, ඔබේ වෛද්‍යවරයාට ඒ බව දැනුම් දෙන්න.

  එසේ කලයුත්තේ ඇයි?

  ඔබට උණ, කැස්ස සහ හුස්ම ගැනීමේ අපහසුතාවයක් ඇතිනම් වහාම වෛද්‍ය ප්‍රතිකාර ලබා ගැනීම වැදගත් වේ. මෙය ශ්වසන ආසාදනයක් හෝ වෙනත් බරපතල රෝගී තත්වයක් නිසා විය හැක.

  උණ සමඟ ඇතිවන ශ්වසන රෝග ලක්ෂණ විවිධ හේතු නිසා ඇති විය හැකි අතර, ඔබ නව කොරෝනා වෛරස ආසාදන වාර්තා වී ඇති ප්‍රදේශවල සංචාරය කර ඇත්නම් හෝ එම ප්‍රදේශවල සංචාරය කිරීමෙන් පසු ශ්වසන රෝග ලක්ෂණ ඇතිවූ පුද්ගලයෙක් සමීපව ආශ්‍රය කර ඇතිනම්, ඔබේ රෝග ලක්ෂණවලට හේතුව එම වෛරස් ආසාදනය විය හැක.

- ඔබට සුළු ශ්වසන රෝග ලක්ෂණ තිබේ නම් සහ චීනය තුල සංචාරය කර නොමැති නම්, සනීපාරක්ෂක පිළිවෙත් හොඳින් පිළිපදින්න. සුවය ලබන තෙක් නිවසේ රැඳී සිටීම වඩාත් උචිතවේ.

➢ **මෙම වෛරසයෙන් ආරක්ෂා වීමට මම මුඛ ආවරණයක් පැළඳිය යුතුද?**

මුඛ ආවරණයක් පැළඳීමෙන් ඇතැම් ශ්වසන රෝග පැතිරීම සීමා කළ හැකිය.එසේ වුවද, මුඛ ආවරණයක් භාවිතා කිරීමෙන් පමණක් ආසාදනයන් වලක්වා ගත නොහැක. මුඛ ආවරණයක් පැලදීම ඇතුළු අනෙකුත් රෝග නිවාරණ ක්‍රමවේදයන් (සනීපාරක්ෂක පිළිවෙත් සහ ආසාදිත රෝගීන් සමඟ සමීප ආශ්‍රය වළක්වා ගැනීම - අවම වශයෙන් මීටරයක/අඩි තුනක පරතරයක් තබා ගන්න) එක්ව පිළිපැදීමෙන් ආසාදන අවම කර ගත හැක.

ඔබ මුඛ ආවරණයක් පැළඳිය යුතුවන්නේ ඔබට ශ්වසන රෝග ලක්ෂණ (කැස්ස හෝ කිවිසුම්) ඇත්නම් හෝ නව කොරෝනා වෛරස ආසාදනය ඇති බවට සැක කරන්නේ නම් හෝ නව කොරෝනා වෛරස ආසාදනය වී ඇති බවට සැක කරන අයෙකු රැකබලා ගන්නේ නම් පමණි.

නව කොරෝනා වෛරස ආසාදනයක් ඇති බවට සැක කරනු ලබන්නේ චීනයේ මෙම වෛරසය වාර්තා වී ඇති ප්‍රදේශයක සංචාරය කල හෝ චීනයේ සංචාරය කිරීමෙන් පසු ශ්වසන රෝග ලක්ෂණ ඇතිවූ අයෙකු සමඟ සමීපව ඇසුරු කළ පුද්ගලයෙකුය.

### ➢ නිවැරදිව මුඛ ආවරණයක් පැළඳීම සහ බැහැර කිරීම

- මුඛ ආවරණයක් පැළඳීමට පෙර, සබන් යොදා හෝ මධ්‍යසාර අඩංගු අත්සේදුම් දියරයකින් දෑත් සෝදා ගන්න.
- මුඛය සහ නාසය ආවරණය වන පරිදි මුඛ ආවරණය පළඳින්න. මෙහිදී ඔබේ මුහුණ සහ මුඛ ආවරණය අතර හිදැසක් නොතිබිය යුතුය.
- මුඛ ආවරණය පැළඳ සිටින විට එය ස්පර්ශ කිරීමෙන් වළකින්න; ඔබ මුඛ ආවරණය ස්පර්ශ කලහොත්, සබන් යොදා හෝ මධ්‍යසාර අඩංගු අත්සේදුම් දියරයකින් අත් සෝදාගන්න.
- එක් වරක් පමණක් භාවිතයට නිර්දේශිත මුඛ ආවරණ (disposable masks) නැවත භාවිතයෙන් වලකින්න.
- මුඛ ආවරණය ඉවත් කිරීමේදී හිස පිටුපසින් ඇති කොටසින් (රඳවා තබන පටි) අල්ලා ඉවත් කරන්න (මුඛ ආවරණය ඉදිරිපස ස්පර්ශ නොකරන්න); පියනක් සහිත බඳුනක වහාම ඉවතලන්න; සබන් යොදා හෝ මධ්‍යසාර අඩංගු අත්සේදුම් දියරයකින් අත් සෝදාගන්න.

### ➢ මෙම වෛරසය වැළඳිය හැක්කේ කාටද?

වෛරසය ව්‍යාප්ත වන ප්‍රදේශයක ජීවත්වන හෝ එවැනි ප්‍රදේශයක සංචාරය කරන පුද්ගලයින්හට මෙම ආසාදනය ඇතිවීමේ අවදානමක් ඇත. දැනට බහුතරයක් ආසාදිතයින් වාර්තාවන්නේ මෙම වෛරසය පැතිර යන රටක් වන චීනයෙනි. වෙනත් රටවලින් වාර්තා වූ ආසාදිත පුද්ගලයන් මෑතදී චීනයේ සංචාරය කල එසේත් නැතිනම් එලෙස සංචාරය කල පුද්ගලයන් සමීපව ඇසුරු කල පුද්ගලයන්ය. නව කොරෝනා වෛරසයෙන් ආසාදිත වූ පුද්ගලයන් රැකබලා ගන්නා සෞඛ්‍ය කාර්ය මණ්ඩලයට රෝගය වැළඳීමට වැඩි අවදානමක් ඇති අතර ඔවුන් එම වෛරසයෙන් ආසාදනය වීම වැළැක්වීමට සුදුසු ක්‍රියාමාර්ග අනුගමනය කල යුතුය.

- **දරුණු රෝග තත්ත්වයක් ඇතිවීමේ අවධානමක් ඇත්තේ කාටද?**

නව කොරෝනා වෛරසය පිළිබඳව තව දුරටත් අධ්‍යයනය කරමින් පවතින අතර, මේ දක්වා, වයස්ගත පුද්ගලයින්ට හා වෙනත් රෝගවලින් පෙලෙන පුද්ගලයින්ට (දියවැඩියාව හා හෘද රෝග වැනි) තදබල ලෙස රෝගාතුර වීමේ වැඩි අවදානමක් ඇත.

- **මෙම වෛරසය පැතිරෙන්නේ කෙසේද?**

නව කොරෝනා වෛරසය ශ්වසන පද්ධතිය ආශ්‍රිත වෛරසයකි. මූලික වශයෙන් ආසාදිත පුද්ගලයෙකු කහින විටදී, කිවිසුම් යන විටදී පිටවන බිඳිති මඟින් හෝ කෙල බිඳිති මඟින් හෝ නාසයෙන් පිටවන ශ්‍රාවයන් මඟින් මෙම වෛරසය අනෙකුත් පුද්ගලයන්හට පැතිරිය හැක. එම නිසා, සෑම පුද්ගලයෙකුම නිසි සනීපාරක්ෂක ක්‍රම අනුගමනය කිරීම වැදගත්ය (උදාහරණයක් ලෙස, කහිනවිට හෝ කිවිසුම් යනවිට වැලමිටෙන් හෝ ටිෂූ කඩදාසියකින් ඔබගේ මුඛය හා නාසය ආවරණය කර ගන්න. එම ටිෂූ කඩදාසිය වහාම පියනක් සහිත බඳුනකට ඉවතලන්න). එමෙන්ම සබන් යොදා හෝ මධ්‍යසාර අඩංගු අත්සේදුම් දියරයකින් නිතර දෑත් සෝදා ගන්න.

- **බාහිර පෘෂ්ටයන් මත මෙම වෛරසය කොපමණ කාලයක් නොනැසී පැවතිය හැකිද?**

කොරෝනා වෛරසය කොපමණ කාලයක් බාහිර පෘෂ්ටයන් මත නොනැසී පවතීදැයි නිශ්චිතව හඳුනාගෙන නොමැති අතර දැනට ඇති තොරතුරු අනුව පැය කිහිපයක් එලෙස නොනැසී පැවතිය හැක. සරල විෂබීජ නාශක භාවිතා කිරීම මඟින් මෙම වෛරසය විනාශ වන අතර තවදුරටත් මිනිසුන්ට ආසාදනය වීම වළක්වා ගත හැක.

- **කොරෝනා වෛරස ආසාදනය වෙනත් ශ්වසන ආසාදනවලින් වෙනස් වන්නේ කෙසේද?**

කොරෝනා වෛරස ආසාදිත පුද්ගලයින්ට උණ, කැස්ස සහ නාසයෙන් දියර ගැලීම වැනි රෝග ලක්ෂණ ඇතිවේ. මෙවැනි රෝග ලක්ෂණ වෙනත් වෛරස මඟින් ඇතිවන ශ්වසන ආසාදනවලදී ද දැකිය හැක. රෝග ලක්ෂණවල ඇති සමානකම් නිසා, රෝග ලක්ෂණ මත පමණක් රෝගය හඳුනා ගැනීම දුෂ්කර විය හැකිය. එබැවින් යමෙකුට නව කොරෝනා වෛරසය වැලදී තිබේදැයි තහවුරු කිරීමට රසායනාගාර පරීක්ෂණ අවශ්‍ය වේ. කැස්ස, උණ හා ශ්වසන අපහසුතා ඇති පුද්ගලයන් ප්‍රමාදයකින් තොරව වෛද්‍ය ප්‍රතිකාර සඳහා යොමුවීම වැදගත් වේ.

- **වෛරසය ශරීරයට ඇතුළුවීමෙන් පසු රෝග ලක්ෂණ මතුවීමට ගතවන කාලය (බීජෞෂණ සමය) කොපමණද?**

දැනට පවතින තොරතුරුවලට අනුව මෙම කාලය දින 14ක් දක්වා විය හැක. ලෝක සෞඛ්‍ය සංවිධානය නිර්දේශ කරන්නේ ආසාදනය තහවුරු කරන ලද රෝගීන් ඇසුරු කල පුද්ගලයින් දින 14 ක කාලයක් දක්වා පසු විපරම් කල යුතු බවයි.

- **නව කොරෝනා වෛරසය කිසිම රෝග ලක්ෂණයක් නොමැති පුද්ගලයකුගෙන් පැතිරිය හැකිද?**

සැලකිය යුතු රෝග ලක්ෂණ පෙන්වීමට පෙර නව කොරෝනා වෛරසය ආසාදිත පුද්ගලයෙක්ගෙන් තවත් පුද්ගලයෙකුට රෝගය පැතිරීමට අවකාශ ඇත. කෙසේ වෙතත්, දැනට පවතින තොරතුරු අනුව රෝගය ප්‍රධාන වශයෙන් පැතිරෙන්නේ රෝග ලක්ෂණ ඇති පුද්ගලයින් මඟිනි.

- **චීනයෙන් හෝ වෛරසය හඳුනාගත් වෙනත් ස්ථානයකින් පාර්සලයක් ලැබීම ආරක්ෂිතද?**

ඔව්. එය ආරක්ෂිතයි. පාර්සල ලැබෙන පුද්ගලයන් නව කොරෝනා වෛරසයෙන් ආසාදනය වීමට අවදානමක් නැත. වෙනත් කොරෝනා වෛරස පිළිබඳ ඇති දැනුම අනුව, මෙවැනි වෛරස් ලියුම් හෝ පාර්සල්වල දිගු කලක් සජීවීව පැවතීමට හැකියාවක් නොමැත.

- **නව කොරෝනා වෛරස ආසාදන වැළැක්වීමට සහ ප්‍රතිකාර කිරීමට ප්‍රතිජීවක ඖෂධ භාවිතා කල හැකිද?**

ප්‍රතිජීවක ඖෂධ මඟින් සුව කල හැක්කේ බැක්ටීරියාවලින් ඇතිකරන ආසාදන පමණි. එමඟින් නව කොරෝනා වෛරස වැනි වෛරස ආසාදන සුව කල නොහැක.

- **නව කොරෝනා වෛරසයෙන් ආසාදනය වීම වැළැක්වීමට හෝ ඊට ප්‍රතිකාර ලෙස නිශ්චිත ඖෂධ තිබේද?**

මේ දක්වා, කොරෝනා වයිරස් ආසාදනය වැළැක්වීමට හෝ ප්‍රතිකාර කිරීමට නිශ්චිත ඖෂධයක් නිර්දේශ කර නොමැත. කෙසේ වෙතත්, නව කොරෝනා වෛරසය ආසාදිතවූවන්ට රෝග ලක්ෂණ සමනය කිරීමට සුදුසු ප්‍රතිකාර ලබා දිය යුතු අතර වඩාත් දරුණු ලෙස රෝගාතුර වූ අයට ප්‍රශස්ත උපකාරක සත්කාර (supportive care) ලබා දිය යුතුය.

නව කොරෝනා වෛරස ආසාදනයෙන් ආරක්ෂා වීමට, ඔබ දෑත් සහ ශ්වසන සනීපාරක්ෂක ක්‍රම අනුගමනය කල යුතු අතර, හැකි සෑම විටම, කැස්ස සහ කිවිසුම් යෑම වැනි ශ්වසන රෝග ලක්ෂණ පෙන්නුම් කරන ඕනෑම අයෙකු සමඟ සමීප සම්බන්ධතා පැවැත්වීමෙන් වැළකිය යුතුය.

විටමින් c පෙති ගැනීම, මුඛ ආවරණ කිහිපයක් පැලඳීම හා ප්‍රතිජීවක ඖෂධ වෛද්‍ය නිර්දේශයකින් තොරව ලබා ගැනීම නව කොරෝනා වෛරසයෙන් වැලකීම සඳහා නිර්දේශ කරනු නොලැබේ. මෙම පිළිවෙත් ඔබව වෛරසයෙන් ආරක්ෂා නොකරන අතර ඔබට හානිදායකද විය හැක.

කෙසේ වෙතත්, ඔබට උණ, කැස්ස සහ හුස්ම ගැනීමේ අපහසුතාවයක් ඇත්නම් වඩාත් දරුණු ආසාදනයක් ඇතිවීමේ අවදානම අවම කර ගැනීම සඳහා කල්තියා වෛද්‍ය ප්‍රතිකාර ලබා ගන්න. මෑත කාලීනව ඔබ සංචාරය කල ප්‍රදේශ පිළිබඳව ඔබේ වෛද්‍යවරයා දැනුවත් කරන්න.

---

### ප්‍රශ්න හා පිළිතුරු වැඩිදුරටත්

- **නව කොරෝනා වයිරසය, අසාදිත පුද්ගලයෙකුගෙන් තවත් පුද්ගලයන් කීදෙනෙකුට පැතිර යා (සම්ප්‍රේෂණය විය හැකි) හැකිද?**

මෙලෙස රෝගය පැතිරිය හැකි පුද්ගලයන් සංඛ්‍යාව R0 ("R naught") නම් දර්ශකයක් මගින් ඉදිරිපත් කරනු ලැබේ. එමගින් ආසාදිත කාලපරිච්ඡේදය තුළ සාමාන්‍යයෙන් එක් රෝගියෙකුගෙන්, රෝගය අසාදනය කළ හැකි, කලින් අසාදනය නොවුණු පුද්ගලයන් ගණන දැක්වේ. ආසාදන කිහිපයක R0 අගයන් පහත සඳහන්වේ.

| | |
|---|---|
| MERS - CoV <1 | ඉබෝලා - 1.5-2 |
| SARS - 4 | HIV - 4 |
| සරම්ප - 12-18 | |

නව කොරෝනා වෛරසය සඳහා ඇස්තමේන්තුගත මෙම අගය, 2020/01/30 වන විට 1.4 - 2.5 වේ (නව දත්ත ලැබීමත් සමග මෙම අගය වෙනස් වීමට ඉඩ ඇත).

- **මෙම රෝගය කොතරම් මාරාන්තිකද?**

මාරාන්තික බව මනිනු ලබන්නේ සිද්ධි මරණ අනුපාතය (Case Fatality Rate) නමින් හැඳින්වෙන දර්ශකයක් මඟිනි. එය ප්‍රතිශතයක් ලෙස ඉදිරිපත් කෙරේ. ආසාදිත පුද්ගලයින් 100 දෙනෙකුගෙන් කීදෙනෙක් මරණයට පත්විය හැකි දැයි එමගින් අදහස් කෙරේ. 2002-2003 වසර වලදී ඇති වූ SARS වසංගතයේදී මෙම අගය 9.6% ක් ද, 2012 දී ඇති වූ MERS කොරෝනා වසංගතයේදී 34.4% ක් ද විය. නව කොරෝනා අසාදනය සඳහා එය 2% ක් පමණ වන බව ගණන් බලා ඇත.

- **නව කොරෝනා වයිරසය වාර්තා වූ රටක සිට මම ශ්‍රී ලංකාවට පැමිණියේ දින 14 ක් තුලදීය. මම කළ යුත්තේ කුමක් ද?**

කරුණාකර මෙම වෙබ් අඩවියේ "අධි අවදානම් සහිත රටක සිට නැවත පැමිණෙන අය සඳහා උපදෙස්" (Advices for high risk country returnee) වෙත යොමු වන්න.

- **මම අධි අවදානම් රටක සිට ශ්‍රී ලංකාවට පැමිණ දැනට දින 14 ක් ගතවී ඇත. මම කළ යුත්තේ කුමක් ද?**

ඔබට රෝග ලක්ෂණ නොමැති නම්, ඔබ විශේෂයෙන් කිසිවක් කිරීමට අවශ්‍ය නැත. දින 14 කට පසු පෙර සඳහන් කළ රෝග ලක්ෂණ ඇතිවුයේ නම්, එය නව කොරෝනා වෛරසය නිසා ඇතිවුවේ යැයි සිතිය නොහැක. නමුත් ඔබට දින 14 ක් තුළ රෝග ලක්ෂණ ඇති වූයේ නම්, කරුණාකර "අධි අවදානම් සහිත රටක සිට නැවත පැමිණෙන අය සඳහා උපදෙස්" (Advices for high risk country returnee) වෙත යොමු වන්න.

- **නව කොරෝනා වෛරසය සඳහා එන්නතක් තිබේද?**

අද දක්වා, නව කොරෝනා වෛරසය සඳහා කිසිඳු එන්නතක් සොයාගෙන නොමැත.

- **පාසල් දරුවන්ට දිය යුතු උපදෙස් මොනවාද?**

කරුණාකර මෙම වෙබ් අඩවියේ ඇති "පාසල් ළමුන් සඳහා තොරතුරු පත්‍රිකාව" (Information leaflet to school children) වෙත යොමු වන්න.

**වසංගත රෝග විද්‍යා අංශය**

**සෞඛ්‍ය හා දේශීය වෛද්‍ය සේවා අමාත්‍යාංශය**

**12.02.2020**